සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
සමුர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/EST/02/02/Common
ඔබේ අංකය / உமதுஇல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2018.09.10

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන දින සිට විශ්‍රාම වැටුපට දායක වූ සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට වැඩ බැලීමේ පත්වීම් ලිපි ලබා දීම.</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ අමතන ලද මාගේ සමාංක හා 2018.01.30 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියෙන් ලබා ගන්නා ලද වැඩ බැලීමේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් පිළිබඳ විස්තර අනුව වැඩබැලීම සඳහා පත් කර ඇති සියලු නිලධාරීන් දිගු කාලයක් සඳහා වැඩ බැලීමට පත් කර ඇති බව අනාවරණය වී ඇත. එවැනි අවස්ථාවක ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.5 වගන්තිය ප්‍රකාරව රාජකාරි ඉටු කිරීම සඳහා පත් කළ යුතුය.

03. එබැවින්, ඔබ දිස්ත්‍රික්කයේ රාජකාරි ඉටු කිරීම සඳහා දැනට අනුමත පුරප්පාඩු සඳහා පත් කිරීමට අවශ්‍ය සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව තොරතුරු සහ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.3 වගන්තිය ප්‍රකාරව රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු දීමනාව ගෙවීමට අවශ්‍ය කරන ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳව දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

04. තවද, වැඩ බැලීමට පත් නොකර අතිරික්ත පදනමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හෝ දිස්ත්‍රික් මට්ටමින් මුල් සේවා මනාපය පළ කරන ලද සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සිටී නම්, එම නිලධාරීන් නිත්‍ය වශයෙන් පත් කිරීම සිදු කළ නොහැකිද යන වග හා රාජකාරි ඉටු කිරීමට පත් කර ඇති, පුරප්පාඩු තනතුරු පිරවීම පිළිබඳව වාර්තා කරන මෙන් වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

05. ඒ අනුව ඉල්ලා ඇති විස්තරද සමඟ, මේ සමඟ එවා ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර සති දෙකක් ඇතුළත estab@divineguma.gov.lk දරන e-mail ලිපිනයට එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ (පාලන හා ආයතන)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත: ලේකම්, සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - ඔබගේ MSE/ADM/15/43 හා 2018.08.09 දිනැති ලිපිය අනුව කාරුණික දැන ගැනීම සඳහා

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel - | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |